අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය 1 පත්‍රය 10 ශ්‍රේණිය කාලය පැය 1 යි

1. ප්‍රජාතන්ත්‍රවාදය බිහිවූ රට වශයෙන් හැඳින්වෙන්නේ
   1) කියුබාව
   2) ඇමරිකා එක්සත් ජනපදය
   3) ස්විස්ටර්ලන්තය
   4) ග්‍රීසිය
2. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට අයත් නොවන අංගය වනුයේ
   1) සමානාත්මතාවය
   2) ජන විචාරණය
   3) ප්‍රාරම්භනය
   4) පුනරාවර්තනය
3. ජනාධිපතිතුමා හා ඇමති මණ්ඩලය අයත් වන්නේ
   1) අධිකරණයට
   2) ආණ්ඩුවට
   3) විධායකයට
   4) ව්‍යවස්ථාදායකයට
4. එක දේශපාලන පක්ෂයක් පමණක් ඇති රට වනුයේ
   1) ඉන්දියාව 2) නවසීලන්තය 3) කියුබාව 4) එංගලන්තය
5. ව්‍යවස්ථාදායකය හඳුන්වන තවත් නමකි
   1) පළාත් සභාව
   2) පාර්ලිමේන්තුව
   3) ආණ්ඩුව
   4) ඇමති මණ්ඩලය
6. ප්‍රංශ විප්ලවය ඇතිවූ වර්ෂය නම්
   1) 1917 2) 1776 3) 1688 4) 1789
7. රාජ්‍යයකට අයත් අංග 4 කි. මෙම අංග වලට අයත් නොවන්නේ
   1) භූමිය
   2) පරමාධිපත්‍යය
   3) ජනගහනය
   4) ආණ්ඩුව
8. ජනතාවට ඔවුන් පත්කළ දූෂිත නිලධාරීන් හෝ දේශපාලඥයින් ආපසු කැඳවීමට හෝ තනතුරු අහෝසි කිරීමට ඇති හැකියාව
   1) ජන විචාරණය
   2) ප්‍රාරම්භනය
   3) පුනරාවර්තනය
   4) ජනමත විමසුම
9. ජාතික රාජ්‍යය ආරම්භය සිදුවූයේ
   1) 19 වන සියවසේදීය
   2) 20 වන සියවසේදීය
   3) 18 වන සියවසේදීය
   4) 17 වන සියවසේදීය
10. ශ්‍රී ලංකාවේ මැතිවරණයකින් පත්වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ධුර කාලය
    1) අවු 05කි. 2) අවු 06කි. 3) අවු 04කි. 4) අවු 07කි.
11. කිසියම් බලගතු සංස්කෘතියක් විසින් තවත් සංස්කෘතියක් ආක්‍රමණය කළ අවස්ථාවක ප්‍රබල සංස්කෘතිය විසින් යටත් වූ සංස්කෘතිය වෙත ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ ආරෝපණය කිරීම හඳුන්වන්නේ
    1) විසරණය
    2) සංක්‍රමණ
    3) ආක්‍රමණ
    4) සංස්කෘතික සංකර්පණය
12. කඩදාසි නිෂ්පාදනය ආරම්භ වූ රට
    1) පකිස්ථානය
    2) චීනය
    3) ජපානය
    4) එංගලන්තය
13. පහත සඳහන් කරුණු අතරින් දේශපාලන අයිතිවාසිකමක් වන්නේ කුමක්දැයි තෝරන්න.
    1) අධ්‍යාපනය ලැබීමේ අයිතිය



edulanka.lk

2) ආණ්ඩුව විවේචනය කිරීමේ අයිතිය
3) කැමති පරිදි රැකියාවක් කිරීමේ අයිතිය
4) කැමති ප්‍රදේශයක ජීවත්වීමේ අයිතිය

14. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගතකරණයේදී හඳුනාගත හැකි ප්‍රධාන ව්‍යුහයන් තුනකි. එය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1) මධ්‍යම ආණ්ඩුව පළාත් සභා හා පළාත් පාලනය
2) මධ්‍යම ආණ්ඩුව ප්‍රාදේශීය සභා හා නගර සභා
3) පළාත් සභා මහ නගර සභා හා මධ්‍යම ආණ්ඩුව
4) පළාත් සභා දිස්ත්‍රික් සභා හා නගර සභා

15. ශ්‍රමයට ගෙවන ගෙවීම් හඳුන්වන්නේ
1) බදු කුලිය 2) වැටුප 3) ලාභය 4) පොළී

16. ප්‍රාග්ධනයට කරන ගෙවීම් හඳුන්වන්නේ
1) පොළී 2) ලාභ 3) බදු කුලිය 4) වැටුප

17. වෙල්ගම් වෙහෙර පිහිටා ඇත්තේ
1) මඩකලපුව 2) ත්‍රිකුණාමලය 3) යාපනය 4) අනුරාධපුරය

18. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක නොවීමට හේතු වලින් එකක් නොවන්නේ
1) වර්තමාන රාජ්‍ය වල භූමිය විශාල වීම
2) ජනගහන වර්ධනයේ බලපෑම
3) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක නොවීම
4) සමාජය සංකීර්ණ වීම

19. පාසල් ශිෂ්‍යයෙක් / ශිෂ්‍යාවක් ලෙස ඔබ සතු යුතුකමක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක්ද?
1) පාසලේ දේපල ආරක්ෂා කිරීම කෙරෙහි ඒ තරම් උනන්දුවක් නොදැක්වීම.
2) සහෝදර සිසුන් සමග සහජීවනයෙන් ජීවත් වීම.
3) හොඳ විනයක් හා ශික්ෂණයක් ඇතිව කටයුතු කිරීම.
4) මැනවින් කීකරුව ඉගෙනීමේ කටයුතු කිරීම.

20. පළාත් සභා බිහිවූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ
1) 13 සංශෝධනය මගිනි
2) 12 වන සංශෝධනය මගිනි
3) 17 වන සංශෝධනය මගිනි
4) 18 වන සංශෝධනය මගිනි

21. මධ්‍යම ආණ්ඩුවක් හා ප්‍රාන්ත ආණ්ඩුවලින් සමන්විත රාජ්‍යය හඳුන්වන්නේ
1) සන්ධීය ආණ්ඩු වශයෙනි.
2) ඒකීය ආණ්ඩු වශයෙනි.
3) ප්‍රාන්ත ආණ්ඩු වශයෙනි.
4) පාර්ලිමේන්තු ආණ්ඩු වශයෙනි.

22. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීමට අවශ්‍ය සාධකයක් නොවන්නේ
1) ජනතාවට දේශපාලන අවබෝධය තිබීම.
2) ආදර්ශවත් උදාර නායකත්වය.
3) දියුණු ආර්ථිකයක් පැවතීම.
4) එක පක්ෂයක් පමණක් පැවතීම.

23. ශ්‍රී ලංකාවේ පළාත් සභා හා මධ්‍යම ආණ්ඩුව අතරේ බලය බෙදාහැරීම ලැයිස්තු 3 කින් සිදුකර ඇත. මින් සමගාමී ලැයිස්තුව යනු
1) පළාත් සභාවට අයිති බලතලයි.
2) මධ්‍යම ආණ්ඩුවට අයිති බලතලයි.
3) පළාත් සභා හා මධ්‍යම ආණ්ඩුවට අයිති බලතලයි.
4) පළාත් පාලන ආයතන වලට අයිති බලතලයි.


ඉස්කෝලේ edulanka.lk

24. ශ්‍රී ලංකාවේ පළාත් සභාවල නාමික විධායක ලෙස කටයුතු කරන්නේ
    1) පළාත් සභා මන්ත්‍රීවරුයි
    2) පළාත් සභා ඇමතිවරුයි
    3) මහ ඇමතිවරයායි
    4) පළාත් ආණ්ඩුකාරවරයායි
25. පළාත් සභාවක සිටින ඇමතිවරු සංඛ්‍යාව
    1) තුනකි
    2) හතරකි
    3) හයකි
    4) අටකි
26. ඇමරිකා එක්සත් ජනපදයේ ඇත්තේ.............................................................. ආණ්ඩුක්‍රමයකි.
27. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග සංඛ්‍යාව............................................ කි.
28. කුමක් කොපමණ කෙසේ කා සඳහා නිෂ්පාදනය කරන්නේද යන ප්‍රශ්න..................................................... නමින් හැඳින්වේ.
29. මුළු ලොවම එකම ගම්මානයක් ලෙස හෙවත් විශ්ව ගම්මානයක් ලෙස සැලකීම..................................................... යනුවෙන් හැඳින්වේ.
30. වර්තමාන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට තෝරාගන්නා මන්ත්‍රීවරු සංඛ්‍යාව........................................... කි.
31. ශ්‍රී ලංකාවේ ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක වන්නේ
    1) බදුල්ල, නුවරඑළිය
    2) බදුල්ල, මොණරාගල
    3) බදුල්ල, අම්පාර
    4) බදුල්ල, මාතලේ
32. පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධීකරණ කටයුතු කරන්නේ
    1) පළාත් ආණ්ඩුකාරයායි
    2) මහ ඇමතියි
    3) පළාත් මන්ත්‍රීවරුන්ය
    4) පළාත් ඇමතිවරුය
33. රටක මූලික නීතිය ලෙස හැඳින්වෙන්නේ
    1) අධිකරණයයි
    2) ව්‍යවස්ථාදායකයයි
    3) ශ්‍රේෂ්ඨාධිකරණයයි
    4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි
34. සංචාරක කටයුතු සඳහාත් රැකියා කිරීම අධ්‍යාපනය වැනි විවිධ හේතු මත රටකින් තවත් රටකට යෑම හඳුන්වන්නේ
    1) ආක්‍රමණය නමිනි
    2) සංක්‍රමණය නමිනි
    3) විසරණය නමිනි
    4) වාණිජකරණය නමිනි
35. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුරවැසියන් අතර ඇතිවන ගැටුම් නිරාකරණය කරනු ලබන්නේ
    1) ජනාධිපතිවරයා විසිනි
    2) අධිකරණය විසිනි
    3) විධායකය විසිනි
    4) ව්‍යවස්ථාදායකය විසිනි
36. නීති සම්පාදනය කරන ආයතනය වනුයේ
    1) අධිකරණයයි
    2) ව්‍යවස්ථාදායකයයි
    3) විධායකයයි
    4) ජනාධිපතිවරයායි
37. නීති ක්‍රියාත්මක කරන ආයතනය වනුයේ
    1) අධිකරණයයි
    2) ව්‍යවස්ථාදායකයයි
    3) විධායකයයි
    4) පළාත් සභාවයි
38. අගමැතිවරයාට විධායක බලතල හිමිව ඇති ආණ්ඩු ක්‍රමය නම්
    1) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයයි.
    2) ජනාධිපති ආණ්ඩු ක්‍රමයයි.
    3) ඒකීය ආණ්ඩු ක්‍රමයයි.
    4) සන්ධීය ආණ්ඩු ක්‍රමයයි.
39. ජාතික රාජ්‍යය සුවිශේෂී ලෙස නැගී සිටීමට හේතුවක් නොවන්නේ
    1) යුධ හා නාවික ශක්තිය
    2) දියුණු ආර්ථිකය
    3) ජාතීන්ගේ නිර්මාණශීලී හැකියාව
    4) ජාතීන්ගේ අසමගිය
40. සන්ධීය රාජ්‍යයකට උදාහරණයකි



ඉස්කෝලේ edulanka.lk

1) ජපානය 2) ශ්‍රී ලංකාව 3) මහා බ්‍රිතාන්‍යය 4) ස්විස්ට ලන්තය

අවසාන වාර පරීක්ෂණය - 2010

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය 11 පත්‍රය 10 ශ්‍රේණිය කාලය පැය 02 යි.

1 ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1.
   I. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.
   II. රජයේ රැකියාවක් කරන රජයේ සේවකයකුගෙන් ඉටුවිය යුතු යුතුකම් 2 ක් ලියන්න.
   III. පවුලේ සාමාජිකයෙක් වශයෙන් ඔබගෙන් ඔබේ පවුලට ඉටුවිය යුතු යුතුකම් 2ක් ලියන්න.
   IV. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් රටට සිදුවිය යුතු යුතුකම් 2 ක් ලියන්න.
   V. දේශපාලන අයිතිවාසිකම් 2ක් ලියන්න.
   VI. සිවිල් අයිතිවාසිකම් 2ක් ලියන්න.
   VII. බලය බෙදාහැරීම යනු කුමක්ද? පැහැදිලි කරන්න.
   VIII. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර ඇති ප්‍රධාන ආයතන තුන මොනවාද?
   IX. ආණ්ඩුවක් බෙදී ඇති ප්‍රධාන ආයතන තුන මොනවාද?
   X. ළමා අයිතිවාසිකම් 2ක් ලියන්න.

2.
   I. ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.
   II. (අ) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද?
   (ආ) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද?
   III. වර්තමාන ලෝකයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක නොවීමට හේතු මොනවාද?

3.
   I. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 3ක් ලියන්න.
   II. බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට හේතු මොනවාද?
   III. ශ්‍රී ලංකාව සිංහල දෙමළ මුස්ලිම් ආදී විවිධ සංස්කෘතීන් ජීවත්වන බහු සංස්කෘතික සමාජයකි. බහු සංස්කෘතික සමාජයක එක් එක් සංස්කෘතීන් අතර ගැටළු ඇති නොවීමට රටවැසියන් තුළ වර්ධනය කරගත හැකි ගුණාංග මොනවාද?

4.
   I. හිගකම යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?
   II. පහත සඳහන් නිෂ්පාන සාධක වලට කරන ගෙවීම් මොනවාදැයි ලියන්න.
      - භූමිය
      - ශ්‍රමය
      - ප්‍රාග්ධනය
      - ව්‍යවසාය
   III. ගෝලීයකරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

5.
   I. සන්ධීය රාජ්‍යය සඳහා උදාහරණ 2ක් සපයන්න.
   II. බලය විමධ්‍යගතකරණය යනු කුමක්ද?
   III. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.



www.eduLanka.Lk

6.

I. රාජ්‍යයක අංග 4කි. ඉන් දෙකක් නම් කරන්න.
II. ජාතික රාජ්‍යයක් බිහිවීමට බලපෑ හේතු මොනවාද?
III. වර්තමාන රාජ්‍යයක භූමිකාව (රාජ්‍යය විසින් කළයුතු කාර්ය භාරය) විස්තර කරන්න.

7.

I. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 3ක් ලියන්න.
II. ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත්වන අප තුල ඇති කරගත යුතු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග මොනවාද?
III. ප්‍රජාතන්ත්‍රවාදය නූතන ලෝකයේ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවී ඇති ඇති ගැටළු මොනවාද?

www.eduLanka.LK



ඉස්කෝලේ edulanka.lk